
# 'මැකී ගිය දඩමං'

# වැද්දන් සමඟ නුවරගලට

**පො**ල්ලේබැද්දේ වැදි පරපුර සමග මා කිට්ටු ආශ්‍රයක් ඇති කර ගත්තේ 1965 දී ය. පොල්ලෙබැද්ද ගැන සඳහන් කරන විට නිතැතින්ම සිහියට නැගෙන්නේ දොස්තර ස්පිටල් හෙවත් 'සුදුහුරා' ය. ඔහුගේ විශේෂ උත්සාහයක් නිසා බිංගොඩ සහ මුල්ලෙගම ප්‍රධාන වැදි පරපුරවල ශේෂව පැවති සාමාජිකයන් රජයේ ද ආධාරය ඇතිව පොල්ලෙබැද්ද ගම්මානයේ පදිංචි කරවන ලදී. මෙය සිදු කරන ලද්දේ 1950 දී පමණ ය. ස්පිටල්ගේ 'වන සරණ' (නිසාහාමිගේ කතාව) සහ 'මැකීගිය දඩමං' (පොරොමොලාගෙන් පැවත එන වැදි පරම්පරාවේ වෘත්තාන්තය) නිතර නිතර කිය වීමේ හේතුවෙන් පොල්ලෙබැද්ද දැක බලා ගැනීමට මට ආශාවක් ඇති විය. 1965 දී අම්පාරේ කච්චේරියට ස්ථාන මාරුවීමක් ලැබීම නිසා එයට අවස්ථාව ද ලැබුණි. එවකට මුළු මහත් බින්තැන්නපත්තුව කරවන ලද්දේ දුනුවිල දිසාධිකාරී විසිනි. දැන් එම පත්තුව පදියතලාව හා මහඔය යනුවෙන් උප දිසාපති කොට්ඨාශ දෙකකි.


*රසල් කුරුප්පු*

ස්පිටල්ගේ පොත් වල සඳහන් වන, ඔහු සමග කැලේ ගල් ගුහා සොයමින් කරක් ගහපු නිසාහාමි (මිනීමරු නිසාහාමි) ගැන හොඳට මතක ඇති පරණ පන්නයේ වැද්දන් ස්වල්ප දෙනෙක් මේ දක්වා ද ජීවතුන් අතර සිටීම අපගේ විශාල භාග්‍යයක් සේ සලකමු. පොරොමොල් යකා පොල්ලෙබැද්දේ වැදි නායකයා වශයෙන් අද වුවද සැළකීම් ලබයි. පොරමොලා පොල්ලෙබැද්දේ විසූ ජනප්‍රිය වැදි නායකයෙකි. මිය ගිය අය යකුන් (නෑ යකුන්) වශයෙන් කැලේ ම වාසය කරන බවත්; ඔවුන් ජීවත්ව සිටින අයගේ යහපතට හා අයහපතට බලපාන බවත් වැදි ජනයා විශ්වාස කරති. පොරමොල යකා ද එවැන්නෙකි. ඔහු හැරුණු විට හීන් හඳුනා, තුනා, ඔදනා, ඌයිරා, හීන් කයිරා, ගෝඹා සහ ගෝබිරා නවම ජීවතුන් අතර ය. පොරොමොලා හැරුණු විට මේ අය අතරෙන් මා සමග විශේෂ මිත්‍රත්වයක් ඇති කර ගෙන තිබෙන්නේ හීන් කයිරා සහ ගෝඹා ය. හීන් එකෙක් වශයෙන් ගෝඹා ස්පිටල් සමග නිසාහාමි සොයා ඇවිද ඇත. හීන් කයිරා ගැන ස්පිටල්ට විශේෂ ලැදියාවක් තිබූ බවත් සඳහන් වේ.



නුවරගල

පොල්ලෙබැද්ද ගමට වඩාත්ම කිට්ටුව පිහිටා ඇත්තේ සිතල වන්නිය කඳ ය. මේ හැරුණු විට අලිකාර, ගොරකාන, රාවුල-හෙළ, ඇත්බැද්දෙගල සහ වාලිඹ යන කඳු ගැනත් වැදි වයෝවෘද්ධයන් හට මතක සටහන් එමට ඇත. ඒ කෙසේ වෙතත් මොවුන්ගේ ජීවිතවලට වඩාත්ම කිට්ටුවෙන් සම්බන්ධ වී ඇත්තේ නුවරගලය. ලංකාවේ වැද්දන් ගැන අපූර්ව පොතක් ලියා ඇති සී. ජී. සහ බ්‍රෙන්ඩා සෙලිග්මාන් යුවල 1908-1909 අතර, බින්තැන්න පත්තුව ගවේෂණය කරද්දී පුරාතන සහ අමිශ්‍ර වශයෙන් සැළකිය හැකි වැදි පවුල් හතරක් නුවරගල කඳු අවට මුණ ගැසී ඇත. වරකා, අන්නාසි සහ බඹර පැණි වැඩි වශයෙන් ලබාගත හැකිව තිබුණේ නුවර



ගල පැත්තෙන් බව ස්පිටල්ගේ පොත්වල සඳහන් වේ. කිහිප අවස්ථාවකම පාහේ ස්පිටල් කයිරා හා හඳුනාගේ මඟපෙන්වීම යටතේ නුවරගල කන්ද නැග එහි මුදුනේ රාත්‍රිය ගත කර ඇත. වල්ලි පැහැරගත් නිසාහාමි මධුසමය ගත කිරීම සඳහා නුවරගල ගිය බවක් ද කියැවේ. පොල්ලෙබැද්දේ රැඳී නොසිට නුවර ගල ආදී මැකිගිය අඩමං ඔස්සේ යෑමට මා ස්ථිරවම තීරණය කළේ ගෝඹාගේත්, හීන් කයිරාගේත් පෙරැත්ත කිරීම නිසා ය. නුවරගල මුදුනටම නැග ගත හැකිවේ ද යන්න ගැන මට මුල දී සැකයක් තිබිණ. පොරෝමොල් යකාගේ බාලම පුතා වන සෙල්ලම් වන්නියා ද අපේ නඩයට එක්කර ගනිමු. ඔහු ගෙන් අපට නොසිතූ ලෙස සහයක් සහ ධෛර්යයක් ලැබුණි. මට මෙය ඉතාමත් වැදගත් ගමණක් විය. පොල්ලෙබැද්දේ ගුණවර්ධන මැම්බර් මහතාගේ ගෙදරින් නුවරගල බලා පා නගන අවස්ථාවේ දී මට සිහි වුණේ හරස්ගල පන්සලේ ස්වාමීන් වහන්සේ විසින් ගොතා ඇති ගීයේ පද ස්වල්පයකි.


*නිල්ගල, නිල්ඩබ, ගල්මැද, කිංගොඩ නුවරගල ද වාලිඝ ආදී*
*නිල් රුක්ගොමුවල, ගල්ලෙන්වල අපි සිටියෙමු පෙර කල ගී සැගවී*
*- සිටියෙමු පෙර කල ගී සැගවී*

*කයිරා, තුතා, ගෝඹා, නීලා, පොරෝමොලා සහ බඩපිස්සා*
*කයිරි, තුනී, සුදු බණ්ඩි ඈ නම් ගොත්තෙයි අපගේ පැරැණි*
*- නම් ගොත්තෙයි අපගේ පැරැණි*

*දුනු, හීතල ගෙන බල්ලන් සමගින් මංගව්වාලා වන පොජ්ජේ*
*මුණ්ඩා, හෙම්බා, ගල්ගටරා විද දැමුවෙමු කඳ ගී දිය පොජ්ජේ*
*- දැමුවෙමු කඳ ගී දිය පොජ්ජේ*

පොල්ලෙබැද්ද ගම්මානයේ සිට නුවරගල මුදුණ දක්වා සැතපුම් 8 ක දුරක් යා යුතු වේ. මෙහි පළමු සැතපුම් 11/2 තැනිතලා ප්‍රදේශයක් හරහා වැටී ඇත. වැදි ජනයාගේ ඉපැරැණි ගල්ලෙනක් වශයෙන් සැලකෙන මුත්තාකඩ ගල්ගේ ආසන්නයෙන් අවසන් වන මෙම ප්‍රදේශය, ඔබ්බට අවතීර්ණ වනයේ රඹකැන් ඔයටයි. මුත්තාකඩ ගල්ගේ මා පළමුවෙන් ම දැක බලා ගත් ගල්ලෙනයි. වර්තමානයේ දී නම් එය ඉබාගාතේ සක්මන් කරන 'හිපියන්' විසින් ජරාවාස කර ඇත. නුවරගල පාරේ ඊ ළඟ සැතපුම් 2 1/2 යෑමේ දී තේක්ක වනයායක් මැදින් ගමන් ගත යුතුව ඇත. එය අවසන් වන්නේ නුවරගල ඉදිරිපසින් වැටී ඇති විශාල ගල්තලාවකිනි. මෙතැන් සිට අම්පාරේ මහ ඔය පාරට හැරෙන හන්දිය පසුකරමින් සැතපුමක් පමණ ගිය විට ඝන වනාන්තරයකින් ආරක්ෂිත නුවරගල කන්දේ පාමුලට ළඟාවිය හැකි ය. එහි සිට මුදුණ දක්වා ඇත්තේ සැතපුම් 4 ක ඉතාමත් අසීරු නැග්මකි. මෙතැනින් ගමන් කරන විට පුරාණ පුළුල් මාර්ගයක ශේෂව ඇති අඩිතාලම පැහැදිලිව පෙනේ. 1907 දී ආර්. ලුවිස් නමැත්තා (මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති) නුවරගල තරණය කිරීමෙන් අනතුරුව මෙම මාර්ගය ඔස්සේ අශ්වාරෝහකයෙක්ට වුවද වැඩි අවහිරයක් නොමැතිව ගමන් කළ හැකි බව නිරීක්ෂණය කළේ ය.

අපේ මේ ගමනේ දී නුවක්කුව අනැතිව ඉදිරියෙන් ම ගමන් කළේ ගෝඹා ය. පසුපසින් ම ගමන් කලේ සෙල්ලම් වන්නියා ය. හීන් කයිරා නිතරම මා සමීපයේ සිටි නිසා ඇතැම් අසීරු ස්ථානවල දී ඔහුගේ සහය මට ලැබුණි.




සෙල්ලම් වන්නියා



රසාවා

හවස 3.45 ට පමණ අපි නුවරගල මුදුනට පැමිණි යෙමු. ගල ඉස්මත්තේ කපා ඇති පොකුණ ඉතාමත් සිත්ගන්නා සුළු දර්ශනයකි. බ්‍රොහියර් මෙයට 'කෙම' යන නම යෙදීම වඩා යෝග්‍ය බව පෙන්වා දෙයි. පොකුණ 80' × 60' වර්ග ප්‍රමාණයකින් යුක්ත ය. සාමාන්‍ය ජල මට්ටම අඩි 4 1/2 සිට අඩි 5 අතර ය. මෙය පුරාණ ගල් වඩුවන්ගේ සියුම් ශිල්පීය ක්‍රම විදහා දක්වන ශ්‍රේෂ්ඨ නිර්මාණයකි. මේ පොකුණ පිළිබඳව සිද්ධියක් ස්පිට්ල්ගේ දියණිය වන ක්‍රිස්ටින් විල්සන්ගේ (SURGEON OF THE WILDERNESS) නමැති පොතේ සඳහන් වේ. දහඩිය පිටින් ම වතුරට බැසීමෙන් මහාචාර්ය ලී ස්මිත් අකල් මරණයකින් බේරී ඇත්තේ යාන්තමිනි. එනැන ස්පිට්ල් නොසිටියා නම් මහාචාර්යවරයා එදා මරුමුවට පත්වනවා නිසැක ය. අප ද වතුරට බැස්සේ සැහෙන විවේකයක් ගැනීමෙන් ඉක්බිතිව ය.



ගල ඉස්මත්තේ කපා ඇති පොකුණ

නුවරගල මුදුනේ එක් ඉමක පිහිටා තිබූ ගල්ලෙනේ රැගත කිරීම සැහෙන අවධානමකින් යුතු නිසා ලෙනට ඉහළින් පිහිටි ගල්පොත්තේම රැගත කිරීමට අප තීරණය කළෙමු. මෙය ඉතාමත් ආශ්වාදජනක අත්දැකීම් රාශියකට හේතු වූවකි. දෙපුටුල්ලන් කොටා බෑම (බත්කෑම) මේ ගමනේ දී මහ ජයටම සිදු විය. ඉවුම් පිහුම් වැඩවලට ගෝඹා අති දක්ෂ යෙකි. රසවත් ලෙස කෑම පිසීමට ඔහුට පුළුවන. ගෝඹා සහ ජීන් කයිරා දඩයමක් කිරීමට මාන බලමින් සිටීමුත්, ඒ ගැන මම වැඩි කැමැත්තක් නොදැක්වීමි. ගෝඹාට වැඩියෙන් අවශ්‍ය වූයේ වඳුරෙක් එලා ගැනීමට ය. කෙසේ වෙතත් මේ දෙන්නා එදා සවසුත් පසුදා පාන්දරත්, දඩයමක් සොයා ගිය මුත්, මා විසින් කරන ලද කෙටි ගුරුකමක් නිසා එම උත්සාහයන් ප්‍රතිඵල රහිත විය. එයින් අප අතරේ කිසිදු අමනාපයක් ඇති නොවීය.

එදා රෑ කිසිදු ආවරණයක් නැතිව අපි ගල්පොත්ත මතම නිදා ගත්තෙමු. අඩි 1500 ක පමණ උසක අප නැවතී සිටි නිසා දැඩි සීතලත් පාන්දරින් වැටුණු පිනත් නිසා එතැන එලෙස ලැගුම් ගැනීම එතරම්ම පහසුදායක නොවිණ. සවස ඉතා මහන්සියෙන් එක්රැස් කරන ලද (ගෝඹා සහ ජීන් කයිරා නිශ්ඵල දඩ ගමනේ යෙදෙන විට) දර ගොඩින් සෙල්ලම් වන්නියා අප වාඩිගෙන සිටි ස්ථානය දෙපස දැවුන්ත ගිනිගොඩවල් දෙකක් සකස් කරන ලදී. එයින් සැහෙන උණුසුමක් ලැබුණි. මට නම් නිදා ගැනීමට තරම් හිතක් නොවිය. පාන්දර 2 පමණ වනතෙක් වැද්දන් තිදෙනා හා මා අතර වූයේ ඉතාමත් ප්‍රියජනක සංවාදයකි. අතරින් පතර ගෝඹා සහ සෙල්ලම් වන්නියා තේ පිළියෙල කරදීමට අමතක කළේ නැත. පොල්ලෙබැද්ද වැදි ජනයාගේ වර්තමාන තත්ත්වය, ඔවුන්ගේ ආශාවන්, අපේක්ෂාවන් පැමිණෙන අනේක විධ දුක් ගැහැට සිංහලයින් විසින් කරනු ලබන අනවර හිරිහැර මේ සියල්ල ගැනම ප්‍රවේසමින් කරුණු විමසීමි. ඒවා වැඩි හරියක් පටිගත කරගන්නා ලදී. බාලවියේ දී 'මිනීමරු තිසාහාමි' දුටු අවස්ථාව ජීන් කයිරාට හොඳට මතක ය. එම සිද්ධිය සිහියට නැගෙන විට මුල් අවස්ථාවේ දී ජීන් කයිරා තුළ පහළ වූ භීතිය විද්‍යාමාන වන පරිදි ඔහුගේ ඉරියව් ක්ෂණිකවම වෙනස් වන බවක් දකින්නට තිබිණි. මේ අතරතුර හොර රහසේම වාගේ ගෝඹා සහ ජීන් කයිරා විසින් සෙල්ලම් වන්නියා ගැන රසවත් සිද්ධියක් සඳහන් කරන ලදී. මාස කිහිපයකට ඉහත දී යම් සිද්ධියක් හේතුකොට ගෙන ජීන් කයිරාගේ බාල සොහොයුරා වන ගෝඹරාට සෙල්ලම් වන්නියා දරුණු ආකාරයට අඩම් තේට්ටම් කර ඇත. පොලිස් පරීක්ෂණ හේතු වෙන් සෙල්ලම් වන්නියාටත් නොසැහෙන්ට තලා පෙලා ඇත. කිසිවක් නොදන්නා අහිංසකයකු සේ සෙල්ලම් වන්නියා මා දිහා බලමින් මඳ සිනහවක් දැක්විය. ඔහු තුළ මේ හපන්කම මට විශ්වාස කරන්නට බැරි තරම් ය. මේ ආරවුලට මුල් වූ හේතුන් මට කිසිවෙක්ගෙන් අසා දැනගත නොහැකි විය.

හිමිදිරි පාන්දරම හිරු නැග එනවිට මිටියාවත් සියල්ලම අනුක්‍රමයෙන් අවදි වන ආකාරය පෙනෙන්නේ මන දොළ සපුරාලමිනි. ඒ උදෑසන නුවරගල සහ බැද්දෙගල අතර පිහිටි දුර්ග මාර්ගය දූහුල් වී මිදුම් වලින් පිරී තිබූ ආකාරය මට කිසිදාක අමතක නොවේ.

නුවරගල සිට ආපසු පොල්ලෙබැද්දට යෑම පැය 3 ක් ඇතුළත කළ හැකි විය. පොල්ලෙබැද්දට පැමිණ පොරමොලා සහ හැන්දිගෙන් ද සමු ගැනීමට අමතක නොකළෙමු. දැනටමත් හිරිහැර කිරීම් නිසා ජීන්


කයිරා සහ සෙල්ලම් වන්නියා සැතපුම් 3 ක් පමණ ඈතින් පිහිටි ගල්වල යාය පැත්තේ පදිංචියට ගොස් ය. ගොඹා නම් තවමත් ඔහුගේ පොල්ලෙබැද්දෙ ඉඩමේ පදිංචි වී සිටියි. එය අත්හැරීමට ඔහු අදහස් නොකරයි. එසේ වුවද සිංහල වෙළෙඳුන්ගේ ප්‍රයෝගකාරී ක්‍රියා අවසන් වී නැත.

ඔවුන්ගෙන් සමුගත් අපි මහඔය දක්වා සැතපුම් 7 ක් පාගමන ඇරඹුවෙමු. එහෙත් එන මග ද එක් විශේෂ කෙනෙක් හමුවිය යුතුව තිබුණි. ඒ නිල්ඔබ පදිංචි ටී. බී. ගමන්ඩි විශ්‍රාමලත් ආරච්චි මහත්තයා ය. ස්පිටල් මේ ප්‍රදේශයේ සැරිසරන විට තිසාහාමි නීතියේ රැහැණින් පිට පැන සිටින විට මේ වසමේ රාජකාරි කළේ ටී. බී. ගමන්ඩි මහතා ය. ඔහුන්මා සමග සෑහෙන්නට කුලුපග ය. ස්පිටල් සහ තිසාහාමි ගැනත් වැදි වෘත්තාන්තය ගැනත් ඔහු කියන කතා ඉතාමත් රසවත් ය. ඒවා වෙනම ලිපියක් මගින් පාඨකයින් අතට පත් කළ යුතු යයි සිතේ.

## හීන් කයිරා ගැයූ 'නුවරගල' කවි

ගමක සෙනග ඉදගෙන කළ වැඩක් දෝ
නුවරක සෙනග ඉදගෙන කළ වැඩක් දෝ
වඩුවෙක් ඇවිත් ඉදගෙන කළ වැඩක් දෝ
නුවරගලේ විල කැපුවේ රජෙක් දෝ

ගමක සෙනග ඉදගෙන කළ වැඩක් වෙද
නුවරක සෙනග ඉදගෙන කළ වැඩක් වෙද
වඩුවෙක් ඇවිත් ඉදගෙන කළ වැඩක් වෙද
නුවරගලේ විල කැපුවේ රජෙක් වෙද



සොරබොරවැව

ඔබත් මොබත් ඔබ සොර බොර වැවා ණෝ
අඩා දිය වැදෙන මහවැලි ගඟා ණෝ
දිය නොසිදෙයි ඔබ මහවැලි ගඟා ණෝ
නිල් මල් බිසවි දිය කෙළිනා වැවා ණෝ

